# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව

## ඔක්තොම්බර් 01 වන සතිය - බුද්ධ ධර්මය - 4 ශ්‍රේණිය

සැකසුම - එම්.වී.සම්පත් බන්ධු ගුණසේකර - ර/බළ/වෙළගපොළ විද්‍යාලය

**පුංචි දුවේ පුතේ, අම්මට හරි තාත්තට හරි මේ ප්‍රශ්න ටික අහන්න කියන්න.ඔයගොල්ලො උත්තර දෙන්න.**

1. **ගුණමකු දනන්** හා යන කවිය මතකයෙන් කියන්න.
2. **සුභාසිතා ච යා වාචා** යන ගාථාව කියන්න.
3. **ඔකාස අහං භන්තේ තිසරණේන සද්ධිං** යන ගාථාව කියන්න.
4. **බුදු හාමුදුරුවො අපිත් දකින්නැති** ගීතය ගායනා කරන්න.
5. **නිබ්බුතා නූන සා මාතා** යන ගථාව කියන්න.
6. **යං නම්මදාය නදියා පුලිනේච තීරේ** යන ගාථාව කටපාඩමින් කියන්න.
7. **අදමින් ජීවත් වනවා විතරට** යන කවිය මතකයෙන් කියන්න.
8. **පුඤ්ඤානි කයිරාථ සුඛාවහානි** යන බණ පදයේ තේරුම කුමක් ද?
9. **ධම්මං විනා නත්ථි පිතා ච මාතා** යන ගාථාව කියන්න.
10. **බුද්ධං සරණේ සිරස දරා** ගෙන යන කවිය කටපාඩමින් කියන්න.

**දැන් අපි මේවට උත්තර ලියමු දුවේ පුතේ,**

- පහත සඳහන් වැකි හරි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද වරහන් තුළ යොදන්න.

1. පිරිත් මණ්ඩපය තුළ සංඝ රත්නය සංකේතවත් වන්නේ ධාතු කරඬුවෙනි ( )
2. හොඳ මිතුරන් සැමවිටම අපව විපතට පත් කරයි. ( )
3. යේ ධම්මා හේතුප්පභවා යන ගාථාවේ පද දෙකක් ඇසූ පමණින් ම උපතිස්ස පිරිවැජි රහත් විය. ( )
4. අසරණ ළමයෙක්ට පොතක් දීම පූජා බුද්ධියෙන් දෙන දානයකි. ( )
5. යහපත් වචනකතා කළයුත්තේ නිවසේ දී පමණය. ( )

- හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. .................බුදුන් දැක නිවන් දකින්ට පින් පුරවමු අපි සංසාරේ (මෛත්‍රී / ගෞතම )
2. සිදුහත් කුමරු ගිහිගෙයින් නික්මුණේ .................අසු පිටය. (කණ්ඩුල / කන්ථක)
3. සිදුහත් කුමරු පැවිදි වී සතියක් ගත කළ අනුපිය අඹ වනය පිහිටියේ .................ගඟ අසළ ය. (නේරංජනා / අනෝමා)
4. කිසාගෝතමියට බුදුරදුන් විසින් රැගෙන ඒමට කීවේ ................................. ය. (අඹ / අබ)
5. ප්‍රඥාවන්තයන් අතර අගතනතුරු හිමි වූයේ................................. තෙරුන්ට ය. (මුගලන් /සැරියුත්)

සැම දෙනාම පරිස්සමට ගෙදර ඉන්න. බුදු සරණයි !